## දැන්වීමයි.
## රාජ්‍ය සේවා කොමිෂන් සභාව
## රේගු අධිකාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම

රේගු අධිකාරී තනතුරෙහි 2018.04.05 දින සිට 2018.12.10 දින දක්වා ඇති වූ පුරප්පාඩු 31 ක් පිරවීම සඳහා නියෝජ්‍ය රේගු අධිකාරීවරුන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ජොෂ්ඨතාවය මත පමණක් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම් :

2:1 වෘත්තීය සුදුසුකම්:

(i) නියෝජ්‍ය රේගු අධිකාරී තනතුරෙහි ස්ථිර පත්වීමක් ලබා තිබීම.

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වූ වසර පහ (05) ක කාලය තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඉන් ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

සටහන :
''කෙසේවතුදු රේගු අධිකාරී තනතුරෙහි පුරප්පාඩුවක් පවතිද්දී ඉහත (i) හි දැක්වෙන පූර්ව අවශ්‍යතාවයන් සපුරා ඇති නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටක එම පුරප්පාඩු පිරවීමට වෙනත් විකල්පයක් නොමැති බව සලකා සහකාර රේගු අධිකාරී I හා II ශ්‍රේණිවල සතුටුදායක සේවා කාලය ගණන්බලා ජොෂ්ඨතම නිලධාරීන් අනෙකුත් පූර්ව අවශ්‍යතා සපුරා තිබීමට යටත්ව, රේගු අධිකාරී තනතුරට පත්කිරීමට සුදුසුකම් ලබයි.''

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය
(ii) පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්ය.
(iii) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, දෙපාර්තමේන්තු නියෝග, රජය මඟින් නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝග වලට යටත් වේ.
(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛවල අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

04. වැටුප් පරිමාණය

මෙම තනතුරට රු.47,615–10x1,335-8x1,630-17x2,170-රු.110,895/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රා.ප.ච. අංක 3/2016 හි අංක SL I – 2016 වැටුප් ඛණ්ඩය)

05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

06. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

I. අයදුම්පත් 2019.04./2 දිනට හෝ එදිනට ප්‍රථම රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු වේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වේ.

III. නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන අංශයේ අධ්‍යක්ෂ මඟින් ඉදිරිපත් කල යුතුය.

IV. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

07. සාවද්‍ය තොරතුරු සැපයීම:

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහකිරීමට කටයුතු කරනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය සහ පත් කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01
2019.03.29

ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග
ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.
ශ්‍රී ලංකාව.